# වර්ෂ 2018 ජනවාරි 01 දා සිට නව ගමන් බලපත්‍ර ලබා ගන්නා ශ්‍රී ලාංකිකයන්ට කෙරෙන විශේෂ නිවේදනයයි.

ශ්‍රී ලංකා රජයේ නව නීති රීති අනුව වර්ෂ 2018 ජනවාරි මස 01 දින සිට රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ මිලාන්හි කොන්සල් ජනරාල් කාර්යාලය හරහා නව ගමන් බලපත්‍ර ලබා ගන්නා වයස අවුරුදු 16 - 60 අතර වන සෑම පුද්ගලයෙකුම ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදීම ඔවුන්ගේ ජෛවමිතික දත්ත (ඇඟිලි සළකුණු) බත්තරමුල්ලේ පිහිටි ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ එහි ප්‍රාදේශීය කාර්යාලයකට (මහනුවර, මාතර, වව්නියාව, කුරුණෑගල) ලබාදීම අනිවාර්ය වන අතර එසේ නොකරන පුද්ගලයන්ට රටින් බැහැරව යාමට නොහැකිවනු ඇත.

ඒ අනුව වර්ෂ 2018 ජනවාරි 01 දිනට පසුව රෝමයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ මිලාන්හි කොන්සල් ජනරාල් කාර්යාලය හරහා ලබාගත් ගමන් බලපත්‍රයක් භාවිතාකර ශ්‍රී ලංකාවට යෑමේදී ආගමන විගමන දෙපාර්තමේන්තුව වෙත ගොස් ඇඟිලි සළකුණු ලබාදීමට හැකිවන පරිදි ඔබගේ සංචාරය සැලසුම් කරගන්නා ලෙස ඔබට උපදෙස් ලබා දෙනු ලැබේ.

මේ සඳහා භාවිතා කිරීමට නියමිත නව අයදුම් පත්‍රය අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැක.

මේ පිළිබඳ වැඩි විස්තර ඇතුලත් උපදෙස් පත්‍රිකාව පහත දැක්වේ.

*ශ්‍රී ලංකා තානාපති-රෝමය ඉතාලිය*

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

## විදේශයන්හි සිටින ශ්‍රී ලාංකිකයන් වෙත කෙරෙන වැදගත් නිවේදනයයි

2015 අංක 07 දරණ පනතින් සංශෝධිත 1948 අංක 20 දරණ ආගමික හා විගාමික පනතේ 35 (අ) වගන්තියට අනුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ගමන් බලපත් අයදුම්කරුවන්ගේ ජෛවමිතික දත්ත ලබා ගන්නා අතර ඒ අනුව 2018 ජනවාරි මස 01 දිනෙන් පසු ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල හරහා ගමන් බලපත් නිකුත් කර ඇති ගමන් බලපත් හිමියන්ගේ ඇඟිලි සලකුණු ලබා ගැනීම සඳහා නව ක්‍රමවේදයක් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙනු ලැබේ. මෙම ක්‍රමවේදය යටතේ වයස අවුරුදු 16 - 60 දක්වා වයස් කාණ්ඩයට අයත් සෑම ගමන් බලපත් හිමියෙකුම ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදී ඔවුන්ගේ ජෛවමිතික දත්ත (ඇඟිලි සලකුණු) ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුයි.

- ඒ අනුව ශ්‍රී ලංකාවෙන් පිටව යාමට ප්‍රථම ඔබ විසින් ඇඟිලි සලකුණු ලබා දිය යුතු බවට උපදෙස් ලබා දෙන අතර මෙම අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට නොහැකි වන්නේ නම් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යාම වැලකී යනු ඇත.
- දෙපාර්තමේන්තුව වෙත පැමිණ ඇඟිලි සලකුණු ලබා දීමට තරම් ප්‍රමාණවත් කාලයක් සලසා ගත හැකි වන පරිදි ඔබගේ සංචාරය සූදානම් කර ගන්නා ලෙසට ඔබට උපදෙස් ලබා දෙනු ලැබේ.
- දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය රාජකාරි සිදු කරන රජයේ නිවාඩු දිනයන් හැර සඳුදා සිට සිකුරාදා පෙ.ව. 8.00 සිට ප.ව. 2.00 දක්වා ඔබගේ ඇඟිලි සලකුණු ලබා දීමේ හැකියාව ඇත.

**ජෛවමිතික දත්ත ලබා ගැනීම සඳහා වන ක්‍රමවේදය**

**1 වන පියවර :**

රටට ඇතුළුවීමේදී ඔබ සෘජුවම ප්‍රධාන ආගමන නිලධාරියා (Senior Authorized Officer) වෙතට වාර්තා කළ හැකිය. එසේත් නැතිනම් ආගමන විගමන කවුළුවෙහි (Immigration counter) සිටින ආගමන නිලධාරියා විසින් ගමන් බලපත් හිමියාව ප්‍රධාන ආගමන නිලධාරියා වෙත යොමු කරනු ලැබේ.

**2 වන පියවර :**

සුවිශේෂී අංකයකින් යුත් ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ආකෘති පත්‍රය (BDA) පිටපත් දෙකකින් යුතුව ප්‍රධාන ආගමන නිලධාරියා විසින් ඔබට නිකුත් කරනු ඇත. ආකෘති පත්‍ර දෙකෙහිම ඔබ විසින් අත්සන් කළ යුතු අතර ඉන් එක පිටපතක් ඔබට ලබා දෙනු ලැබේ. ජෛවමිතික දත්ත ලබා දීම සඳහා මෙම ආකෘති පත්‍රය (BDA) ඔබ විසින් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**3 වන පියවර :**

දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත වෙන් කිරීමේ ක්‍රමවේදය තුළින් ඇඟිලි සලකුණු ලබා දීම සඳහා ඔබට පහසු දිනය සහ වේලාව වෙන් කර ගත හැකිය. (www.immigration.gov.lk) එසේත් නැතිනම් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට හෝ ප්‍රාදේශීය කාර්යාලයකට පැමිණ මේ සඳහා ටෝකන් අංකයක් ලබා ගත යුතුය.

**4 වන පියවර :**

ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ හෝ ප්‍රාදේශීය කාර්යාලයක විදේශ දූත මණ්ඩල අංශයේ ඇඟිලි සලකුණු ලබාගන්නා කවුළුව වෙත පැමිණ ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ආකෘති පත්‍රය (BDA) භාර දිය යුතුය.

**5 වන පියවර :**

නිලධාරින් ලබා දෙන උපදෙස් අනුගමනය කරමින් ඇඟිලි සලකුණු ලබා දිය යුතුය. ඇඟිලි සලකුණු ලබා ගැනීමේ ක්‍රමවේදය නිමකිරීම සඳහා සාමාන්‍යයෙන් ගතවන කාලය විනාඩි 45ක් පමණ වේ.

**6 වන පියවර :**

ඇඟිලි සලකුණු ලබාදීම අවසන්වීමෙන් පසුව ජෛවමිතික දත්ත ලබාදීම සාර්ථකව නිම කර තිබේද නැද්ද යන්න තහවුරු කර ගැනීම සඳහා ජෛවමිතික දත්ත ප්‍රකාශය ඔබ වෙත නිකුත් කරනු ලැබේ. එමෙන්ම මෙම ක්‍රියාවලිය අවසන් වීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාවෙන් පිටව යාමට හැකිවන පරිදි ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය තුල ඔබේ ගමන් බලපත්‍රය ස්වයංක්‍රීයව සක්‍රියවනු ඇත.

ජෛවමිතික දත්ත ලබා ගැනීමට අදාළ නව ක්‍රමවේදය පිළිබඳ වැඩිදුර තොරතුරු ලබා දැනීම සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ www.immigration.gov.lk වෙබ් අඩවියට පිවිසෙන්න.

එමෙන්ම ඔබට වඩාත් ආසන්නව පිහිටි ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩලයෙන් හෝ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ ප්‍රාදේශීය කාර්යාලවලින් විස්තර ලබාගත හැකිය.

| ස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|
| කොළඹ | විදේශ දූත මණ්ඩල අංශය<br>දෙවන මහල<br>ආගමන හා විගමන දෙපාර්තමේන්තුව<br>"සුහුරුපාය"<br>ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල. | + 94 11 5329230 |
| මාතර | 9, ශ්‍රී විජය ගොඩනැගිල්ල, රාහුල පාර, මාතර. | + 94 41 5412212 |
| මහනුවර | 42/3, සංඝරාජ මාවත, මහනුවර. | + 94 81 5624470, + 94 81 5624509 |
| වව්නියාව | JC 23, පිටත වටරවුම් පාර, වව්නියාව. | + 94 25 5676344 |
| කුරුණෑගල | 129, දඹුල්ල පාර, කුරුණෑගල. | + 94 37 5550562, + 94 37 5550563 |